# සමුපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
## கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
## Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.


| මගේ අංකය / எனது இல / My No. | SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. | | දිනය / திகதி / Date | 2022.03. 21 |
|---|---|---|---|---|---|

චක්‍රලේඛ අංක 02/2021(I)

සියළුම සමුපකාරවල සභාපතිවරුන් වෙත,

<u>දකුණු පළාතේ සමුපකාර සමිති සේවකයන් සඳහා ප්‍රසූත නිවාඩු</u>

දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් 2021.04.07 දිනැතිව නිකුත් කරනු ලැබූ 02/2021 දරණ චක්‍රලේඛයේ 09 වන ඡේදයේ සඳහන් කරුණු සමුපකාර සමිති මගින් කරනු ලැබූ ඉල්ලීම සළකා බලා පහත පරිදි සංශෝධනය කරනු ලබන අතර, එම කරුණු 2022.03.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය.

02. එහි 09 වන ඡේදය වෙනුවට;
"ඉහත 01 වගන්තියෙහි සඳහන් පරිදි වැටුප් සහිත ප්‍රසූත ලබා ගැනීමෙන් අනතුරුව, අදාළ සේවිකාව ඉල්ලීමක් කරන්නේ නම් දරුවා රැක බලා ගැනීම වෙනුවෙන් දින හතලිස් දෙක (42) ක අඩ වැටුප් සහිත නිවාඩු ලබා දිය යුතුය. දරුවා රැක බලා ගැනීම පිණිස තවදුරටත් නිවාඩු ඉල්ලා සිටින්නේ නම් විශේෂඥ වෛද්‍යවරයෙකුගේ නිර්දේශ මත පමණක් තව දින අසූහතර (84) ක වැටුප් රහිත නිවාඩුවක් ලබා දිය හැකිය." යනුවෙන් සංශෝධනය විය යුතුය.

03. එසේම, 02/2021 චක්‍රලේඛය මගින් මේ වන විටත් අඩ වැටුප් හා වැටුප් රහිත නිවාඩු ලබා සිටින සේවිකාවන්ට මෙම සංශෝධන අදාළ නොවේ.

මෙම චක්‍රලේඛය කොමිෂන් සභාවේ අනුමැතිය මත නිකුත් කරන ලදී.

ජයන්ත ජී.ලියනගේ.
ලේකම් (වැ.බ).
සමුපකාර සේවක කොමිෂන් සභාව
දකුණු පළාත.

ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභා
දකුණු පළාත

පිටපත්
1. ලේකම්, කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන ........ සමුපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.
2. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - දැ.ගැ.ස.
3. දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට


ලේකම් / செயலாளர் / Secretary 091-2232794 | පරිපාලන නිලධාරි / நிர்வாக அதிகாரி / Administrative Officer 091-2234279 | කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax 091-2234383 | වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site www.cec.sp.gov.lk | විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail empcommicoopsp@sltnet.lk